රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு

Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.

சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை.

Independence Square, Colombo 07, Sri Lanka.

මගේ අංකය / எனது இல / My No	CS/SLAS/Vacancies - Reply (Vol – I)	ඔබේ අංකය / உமது இல / Your No		දිනය / திகதி / Date	2023.10.05

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
කොමිෂන් සභා ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

<u>දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය</u>

<u>තනතුරු පුරප්පාඩු - සාමාන්‍යාධිකාරී (HM 1-1) ද්විතීක පදනම මත</u>

සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ සාමාන්‍යාධිකාරී (HM 1-1) තනතුර සඳහා ද්විතීක පදනම මත රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සම්බන්ධයෙන් වන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ වෙබ් අඩවියේ පළ කර ඇති අයදුම්පත් කැඳවීමේ නිවේදනය පහතින් දැක්වේ.

02. ඒ අනුව ඔබ ආයතනයේ සුදුසුකම් සහිත නිලධාරීන් ඉහත කරුණ සම්බන්ධයෙන් දැනුවත් කර ඔවුන් අදාළ තනතුර සඳහා අයදුම් කරන්නේ නම් ස්වකීය සුදුසුකම්, පළපුරුද්ද සහ අනෙකුත් අදාළ තොරතුරු ඇතුළත්ව තමන් විසින් සකස් කර ගන්නා ලද ජීව දත්ත පත්‍රිකාවක්, අදාළ අධ්‍යාපන සහ පළපුරුද්ද සහතික කරන ලද සහතික පත්‍රවල පිටපත් සමග, ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව **2023.10.24** දින හෝ ඊට පෙර ‘”සභාපති, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය, 11 මහල ඒ, සෙත්සිරිපාය දෙවන අදියර, බත්තරමුල්ල” යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන්/ තමා විසින් ගෙනැවිත් භාර දීම හෝ විද්‍යුත් තැපෑලෙන් (natamoh.lk@gmail.com) යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

03. එම තනතුරට අදාළ වන කාර්යභාරය සහ වැඩිමනත් තොරතුරු අවශ්‍ය වේ නම්, “දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ සභාපති - 0112187140” වෙතින් විමසන ලෙස ද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

පී.ඩබ්ලිව්. රාජපක්ෂ
අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට
දුරකථන : 0112-698605 / ෆැක්ස් : 0112 - 683651
විද්‍යුත් ලිපිනය : pubad.dslas@gmail.com

සෞඛ්‍ය අමාත්‍යාංශය
දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය

තනතුරු පුරප්පාඩු - සාමාන්‍යාධිකාරි (HM 1-1)

ද්විතීක පදනම මත

සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ සාමාන්‍යාධිකාරි තනතුර සඳහා **ද්විතීක පදනම මත රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.** මෙම තනතුර සඳහා අයදුම් කිරීමේදී, අයදුම්කරුවන් (ඔහු හෝ ඇය) මෙම තනතුර සඳහා සුදුසුකම් ලදහොත් දැනට සේවයේ නියුතු ස්ථානයෙන් මුදා හැරිය හැකි බවට ස්වකීය අමාත්‍යාංශයේ ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් සහතික කර අයදුම්පත එවිය යුතුය.

අයදුම්කරුවන් ස්වකීය සුදුසුකම්, පළපුරුද්ද සහ අනෙකුත් අදාළ තොරතුරු ඇතුළත්ව තමන් විසින් සකස් කරගන්නා ලද ජීව දත්ත පත්‍රිකාවක්, අදාළ අධ්‍යාපන සහ පළපුරුද්ද සහතික කරන ලද සහතික පත්‍රවල පිටපත් සමඟ, **"සභාපති, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය, 11 වන මහල 'ඒ', සෙත්සිරිපාය දෙවන අදියර, බත්තරමුල්ල"** යන ලිපිනයට **2023 / 10 / 24** දින හෝ ඊට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් / තමා විසින් ගෙනැවිත් භාරදීම හෝ විද්‍යුත් තැපෑලෙන් (විෂය තීරුවෙහි ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කර) එවිය යුතුය. ලියාපදිංචි තැපෑල මගින් යොමු කිරීමේදී ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

මෙම තනතුරු සඳහා බඳවා ගැනීම / නොගැනීම සම්බන්ධව සියලුම බලතල දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය සතුය.

සාමාන්‍යාධිකාරි -තනතුරු 01 (HM 1-1)	
අධ්‍යාපන හා වෘත්තීමය සුදුසුකම්	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් වෛද්‍ය, විද්‍යා, කළමනාකරණ හෝ පරිපාලන උපාධියක් ලබා තිබීම. සමග තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක සාමාජිකත්වය ලබා තිබීම. සහ රාජ්‍ය සේවයේ, සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිලිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.
වයස් සීමාව	2023 / 10/ 24 දිනට අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.
වැටුප් පරිමාණය	**HM 1-1** තනතුරට අදාළ වැටුප් හා දීමනා හිමිවේ (2016.10.21 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 හි විධිවිධාන වලට අනුවය)
රැකියාවේ ස්වභාවය	ද්විතීක පදනම මත

සභාපති
දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය
11 වන මහල "ඒ"
සෙත්සිරිපාය දෙවන අදියර
බත්තරමුල්ල
දු. අං. - 0112187140 ෆැක්ස් - 0112186024
විද්‍යුත් තැපෑල - natamoh.lk@gmail.com
වෙබ් පිටුව - www.nata.gov.lk
18/09/2023